මහජන කාර්යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම් ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩම්වල විස්තර :—

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඩවිල්ලි හත්පත්තුවේ, බස්නාහිර තිරගන්දහයෙ කෝරළේ, මතව නමැති ගම; අංක ඒ 1,620 දරණ මූලික සැලැස්ම

කට්ටි : 1.

ඉඩමේ නම : මුල්ලේවත්ත; විස්තරය : අවුරුදු 20 පොල් ගසක් සහ අඩිපාරක් සහිත පොල් ඉඩම; අයිතිකරු : ඩබ්ලිව්. සයිමන් ඥානරත්න, ආරගොඩ, පොල්ගහවෙල; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 11.7.

කට්ටි : 2.

ඉඩමේ නම : මුල්ලේවත්ත; විස්තරය : අවුරුදු 20 පොල්ගස් 19, අවුරුදු 1 පොල්පැල 2, අවුරුදු 20 හල්මිල්ල ගස් 1, අවුරුදු 1 හල්මිල්ල ගස් 2, අවුරුදු 1 පුවක් ගස් 1, අවුරුදු 8 බෙලිගස් 1, අවුරුදු 1 ලුනුම්දෙල්ල ගසක් සහ අඩිපාරක කොටසක් සහිත පොල් ඉඩම; අයිතිකරු : ඩබ්ලිව්. සයිමන් ඥානරත්න, ආරගොඩ, පොල්ගහවෙල; ප්‍රමාණය : අ. 0, රූ. 3, ප. 39.3.

කට්ටි : 3.

ඉඩමේ නම : මුල්ලේවත්ත; විස්තරය : අවුරුදු 5-10 පොල් ගස් 40, අවුරුදු 20 දිවුල්ගසක්, අවුරුදු 5 කොස්ගස් 3, අවුරුදු 5 දෙහිගස් 2, අවුරුදු 8 කෝපි ගස් 10, අවුරුදු 10 පුලුන්ගස් 4, අවුරුදු 10 අඹගස් 3 සහ අවුරුදු 5 පුවක් ගස් 2 සහිත පොල්ඉඩම සහ හේන; අයිතිකරුවන් : සෝමාවතී කුමාරිහාමි, මතව වලව්ව, කොහිලේගෙදර, ඇතුල්ගල්ගේ සයිමන් කරුණාසිංහ, ඉහළ තලම්පිටිය, කොහිලේගෙදර සහ පී. ආර්. ඇම්. සිට්ටිඅනිඳු, මතව, කොහිලේගෙදර; ප්‍රමාණය : අ. 0, රූ. 3, ප. 22.5.

කට්ටි : 4.

ඉඩමේ නම : මුල්ලේවත්ත නොහොත් අඹතලයවත්ත; විස්තරය: අවුරුදු 2-4 පොල්පැල 10, අවුරුදු 2 ලුනුම්දෙල්ල ගස් 2, අවුරුදු 6, නාරංගසක් සහ අවුරුදු 25 මුරුංගා ගසක් සහිත හේන; අයිතිකරු : ඇතුගල්ගේ සයිමන් කරුණාසිංහ, ඉහළ තලම්පිටිය, කොහිලේගෙදර; ප්‍රමාණය : අ. 0, රූ. 3, ප. 2.3.

කට්ටි : 5.

ඉඩමේ නම : මුල්ලේවත්ත; විස්තරය : පොල්ඉඩමේ කොටස (ගොවිතැනක් නැත); අයිතිකරු : සෝමාවතී කුමාරිහාමි, මතව වලව්ව, කොහිලේගෙදර; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 0.2.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩම්වලට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1961 පෙබරවාරි මස 28 දින පෙ.ව. 10ට මතව ග්‍රාම සංවර්ධන සමිති ශාලාවේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද,

(උ) බදුගන්නන් විසින් බද්ද ආරම්භ වූ අවුරුදු 2 ක් ඇතුළත දී මහනුවර දිසාපති තැනගේ සිත් ගන්නා පරිද්දෙන් එකී ඉඩමෙහි ඉරිදා පාසලක්, පුස්තකාලයක් සහ කියවීම් ශාලාවක් සඳහා අවශ්‍ය ගොඩනැගිලි තනා නිමකළ යුතුය.

(එ) බදුගන්නන් විසින් මෙම ඉඩම ඉරිදා පාසලක්, පුස්තකාලයක් සහ කියවීම් ශාලාවක් තැනීම පිණිස මිස අන්‍ය කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුළතදී මෙම ඉඩම බදු නොදීය යුතු බවට පිළිගැණෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 නොවැම්බර් මස 26 වැනි දින,
කොළඹදීය.

11—925

---

ඇල්.ඇස්. 4662.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

මාතලේ දිස්ත්‍රික්කයේ නැගෙනහිර මාතලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ, ගඟල පල්ලේසිය පත්තුවේ මැදපිහිල්ල ගමෙහි පිහිටි, ප්‍රමාණයෙන් අක්කර 46, රූඩ 0, පර්චස් 24 ක්වූ රජයේ ඉඩමක් දුම්කොළ තවානක් සඳහා බදුදෙන ලෙස සීමාසහිත ලංකා දුම්කොළ සමාගම (සිලෝන් ටොබැකෝ කොම්පැණි ලිමිටඩ්) විසින් ඉල්ලා තිබෙන බව මෙසින් නිවේදනය කෙරේ.

2. යෝජිත තවානෙන් පළාතේ ගම්වාසීන් කීප දෙනෙකුට රක්ෂාවල් ලැබෙනවා ඇත. අවශ්‍ය කාරණය සඳහා ඉඩම දීමට පුළුවන. රජයේ සෙසු කොන්දෙසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසි වලටද යටත් කොට ඉඩම බදුදීමට අදහස් කර ඇත :—

(අ) කාලය : අවුරුදු 10 යි ;

(ආ) බදු මුදල : අවුරුද්දකට රුපියල් 830.70 යි ;

(ඉ) බදු ගන්නා විසින් බද්ද ආරම්භ වූ දින සිට මාස 6ක් ඇතුළත දී—

(i) තවාන පිහිටුවීමට වැඩ ආරම්භ කළ යුතුයි.

(ii) මාතලේ දිසාපති තැන විසින් කලින් අනුමත කරනු ලැබූ සැලසුම් අනුව මෙකී ඉඩමෙහි අවශ්‍ය ගොඩනැගිලි තනා නිමකල යුතුයි.

(ඊ) බදු ගන්නා විසින් මෙම ඉඩම දුම්කොළ තවාන් පිණිස යොදනවා විනා අන්‍ය කටයුත්තකට නොයෙදිය යුතුයි.

3. මෙහි සඳහන් දින සිට සති හයක් (6) ඇතුළත මෙකී ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැණෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළ හොත්, ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960ක්වූ නොවැම්බර් මස 25 වැනි දින,
කොළඹදීය.

11—998

---

අංකය : ඇල්. ජේ. 1833—ඇල්. ඇම්. 526.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ කොට්ඨාශයෙහි, රම්බොඩ වසමට අයත්, පලාගොල්ල ගමෙහි, අංක ඒ. 1707 දරණ මූලික පිඹුරයේ, ප්‍රමාණයෙන් අක්. 0, රූ. 3, ප. 27 ක් වන, අංක 14 දරණ රජයේ ඉඩම් කැබැල්ල, පලාගොල්ල බෞද්ධ සමිතියේ භාරකරුවන් වන, ඩී. ඇම්. මුදියන්සේ සහ විදානගේ සරනේලිස් සිල්වා යන අයවළුන් විසින්, එහි බෞද්ධ විහාරස්ථානයක් පිහිටුවීම සඳහා බදු ඉල්ලා ඇත.

2. මෙහි දැනටමත් බෞද්ධ විහාරස්ථානයක් පිහිටා තිබේ. ඒ සඳහා ඉඩම බදු දීමට පුළුවන. එබැවින්, රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසි වලටද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට ඇත.

(අ) බදු මුදල : වර්‍ෂයකට රු. 2 ශත 50 යි ;

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණු දින සිට අවුරුදු 5 ක් ඇතුළතදී නුවරඑළියේ දිසාපති තැනගේ සිත් ගන්නා පරිදි ඉඩමෙහි සංඝාරාමයක්, බෝමළුවක් සහ විහාර මන්දිරයක් තනා නිම කළ යුතුය ;

(ඉ) බදු ගන්නන් විසින් මෙම ඉඩම බෞද්ධ විහාරස්ථානයක් තැනීම පිණිස මිස අන් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය ;

(ඊ) බදු ගන්නන් විසින් (ආ) ඡේදයෙහි සඳහන් ගොඩනැගිලි සාදා නිම කොට සමසක් ඇතුළත ඒවා මහා භාරකාර තැනගේ අනුමැතිය ලද ඔප්පුවකින් පූජා කළ යුතුය. මෙසේ කළ පසු, ප්‍රස්ථාවේ හැටියට, භාරකාර තැනට හෝ විහාරස්ථානයේ පාලක විහාරාධිපතීන් වහන්සේට හෝ ඉඩම සඳහා 99 අවුරුද්දක බද්දක් දෙනු ලැබේ.

3. මෙහි පහත දැක්වෙන දිනයේ සිට සති 6ක් ඇතුළතදී මෙකී ඉඩම බදු නොදිය යුතු බවට පිළි ගැනෙන හේතු මා වෙත ලියා ඉදිරිපත් නොකළහොත් යථෝක්ත ඉල්ලීම පරිදි ඉඩම බදු දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 නොවැම්බර් මස 25 වැනි දින,
කොළඹ දීය.

11—1163

---

අංකය : ඇල්.ජේ. 1563—ඇල්.ජී. 545.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

නුවරඑළිය දිස්ත්‍රික්කයේ යටිපළාත කෝරළයේ වලපනේ කොට්ඨාශයෙහි හරස්බැද්ද ගමෙහි අංක 250 දරණ අවසාන ගම් පිඹුරයේ අංක 232 දරණ බිම් කැබැල්ලෙන් අක්කර ½ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් හරස්බැද්දේ ඉසිපතනාරාම දායක සමිතියේ භාරකරුවන් වන එච්. ඇල්. ටී. අප්පුහාමි සහ සී. ඩී. යාපා යන අයවලුන් විසින් මීට යාව තිබෙන ඉඩමෙහි පිහිටා තිබෙන බෞද්ධ විහාරස්ථානය පුළුල් කිරීම සඳහා බදු ඉල්ලා ඇත.

2. පන්සල දැනට පිහිටා තිබෙන ඉඩම සඳහා ආණ්ඩුවේ බද්දක් දී තිබේ. යථෝක්ත විහාරස්ථානය පුළුල් කිරීම සඳහා එම ඉඩම ප්‍රමාණවත් නොවේ. ඒ සඳහා දීමට ඉඩම තිබේ. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලට ද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට ඇත :—

(අ) බදු මුදල වර්‍ෂයකට රු. 2යි.

(ආ) බදු ගන්නන් විසින් මෙම ඉඩම බෞද්ධ විහාරස්ථානයක් පිණිස මිස අන් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

(ඉ) බදු ගන්නන් විසින් නුවරඑළියේ දිසාපතිගෙන් කලින් ලබා ගත් අවසරයක් නොමැතිව ඉඩමෙහි තවත් ගොඩනැගිලි තැනිය යුතු නොවේ.

(ඊ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුනු දින සිට අවුරුද්දක් ඇතුළත දී ඉඩමෙහි දැනට ඇති ගොඩනැගිලි මහා භාරකාර තැනගේ අනුමැතිය ලද ඔප්පුවකින් පූජා කළ යුතුය. මෙසේ කළ පසු ප්‍රස්ථාවේ හැටියට භාරකාර තැනට හෝ විහාරස්ථානයේ පාලක විහාරාධිපතීන් වහන්සේට හෝ ඉඩම සඳහා 99 අවුරුද්දක බද්දක් දෙනු ලැබේ.

3. මෙහි පහත දැක්වෙන දිනයේ සිට සති 6ක් ඇතුළත දී මෙකී ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැණෙන හේතු මා වෙත ලියා ඉදිරිපත් නොකළහොත් යථෝක්ත ඉල්ලීම පරිදි ඉඩම බදු දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 නොවැම්බර් මස 25 වැනි දින,
කොළඹ දීය.

11-1161

---

ඉ. කො. අංක : ඇල්.ඇස්. 4503.
දි.ප. අංකය : එල්.ඊ/ඒ 121.

## 21 (2) දරණ රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

හම්බන්තොට දිස්ත්‍රික්කයේ කොටවායේ පිහිටි අංක 255 දරණ අවසාන ගම් පිඹුරයේ අංක 74 සහ 75 දරණ බිම් කැබලි වලින් අක්කර 1/2 (භාගයක) පමණ ආණ්ඩුවේ ඉඩම් කැබැල්ලක් වී ගබඩාවක් සෑදීම සඳහා කොටවාය විවිධ සේවා සමුපකාර සමිතිය බදු ඉල්ලා ඇති බැව් මෙසින් නිවේදනය කෙරේ.

2. අවශ්‍ය ඉඩම දීමට තිබේ. රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලටද යටත් කොට එකී ඉඩම බදු දීමට යෝජනා කර ඇත.

(අ) කාලය : අවුරුදු 30 යි ;

(ඉ) බද්ද : අවුරුද්දකට රු. 6 යි ;

(උ) බදු ගන්නා විසින් බද්ද ආරම්භවූ දින සිට අවුරුදු දෙකක් ඇතුළතදී, හම්බන්තොට දිසාපති තැනගේ සිත් ගන්නා පරිද්දෙන් එම ඉඩමේ වී ගබඩාවක් තනා නිම කළ යුතුයි ;

(එ) බදු ගන්නා විසින් මේ ඉඩම අන් කිසි කටයුත්තකට නොව, ගබඩාවක් සඳහා යෙදවිය යුතුයි.

3. මෙහි සඳහන් දින සිට සති හයක් ඇතුලතදී ඉඩම් කැබැල්ල බදු නොදිය යුතු බවට සෑහෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළ හොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 නොවැම්බර් මස 25 වැනි දින,
කොළඹ දීය.

11—1157

---

අංකය : ඇල්. ඇස්. 4650

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

මන්නාරම් දිස්ත්‍රික්කයේ මන්තායි කොට්ඨාශයේ ඉල්ලුප්පායිකඩවේ (කඩ්ඩාඞීවායල්) හි පිහිටි අක්කර 2 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් කායඝීලයක් හා ගබඩාවක් ඉදිකිරීම සඳහා ඉල්ලුප්පායිකඩ්වේ විවිධ සේවා සමූපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බැව් මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි.

ඉඩමෙහි මායිම් මෙසේය :—

උතුරට : රජයේ ඉඩම් ; නැගෙනහිරට : පූනෙරින්-මන්නාරම් ප්‍රසිද්ධ පාර ; දකුණට : රජයේ ඉඩම් ; බටහිරට : රජයේ ඉඩම්.

2. අවශ්‍ය කාරණය සඳහා ඉඩම බදුදීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලටද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :—

(අ) කාලය : අවුරුදු 30 යි.
(ඉ) බද්ද : අවුරුද්දකට රු. 1 යි.
(උ) බදුගන්නා විසින් බද්ද ආරම්භවූ අවුරුදු 2ක් ඇතුළතදී මන්නාරම් දිසාපති තැනගේ සිත් ගන්නා පරිද්දෙන් එකී ඉඩමෙහි කායඝීලයක් හා ගබඩාවක් තනා නිමකළ යුතුය.
(එ) බදුගන්නා විසින් මෙම ඉඩම කායඝීලයක් හා ගබඩාවක් තැනීම පිණිස මිස අන්‍ය කටයුත්තක් සඳහා නොයෙද විය යුතුය.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුළතදී මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැණෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 නොවැම්බර් මස 25 වැනි දින,
කොළඹදීය.

11-1080

---

අංකය : ඇල්.ජේ. 1858—ඇල්.එච්./ඇල්. 292.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

වවුනියා දිස්ත්‍රික්කයේ, මුහතන්කුලම් ගමෙහි පිහිටි රජයේ ඉඩම් වලින් අක්කර 2ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක්, මුහතන්-කුලම් හින්දු මහ සභාවේ භාරකරුවන් වන මුහතන්කුලම් හි පදිංචි කාසිපිල්ලෙයි නවරත්නම්, ෂන්මුගම් අයියම්පිල්ලෙයි සහ සින්නතම්බි පොන්නයියා යන අයවළුන් විසින් එහි හින්දු පන්සලක් පිහිටුවීම සඳහා බදු ඉල්ලා ඇත.

2. මීට කිට්ටුම වූ හින්දු පන්සල පිහිටා ඇත්තේ මෙහි සිට සැතපුම් 1 1/2ක් පමණ ඈතිනි. යෝජිත මෙම හින්දු පන්සල හින්දු පවුල් 500 කට පමණ ප්‍රයෝජනවත් වේ. ඉඩම බදු දීමට පුළුවන. එබැවින්, රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලටද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට ඇත :—

(අ) කාලය අවුරුදු 99 යි.
(ආ) බදු මුදල : වර්‍ෂයකට රු. 1 ශත 50 යි ;
(ඇ) බදුගන්නන් විසින් බද්ද ඇරඹුනු දින සිට අවුරුදු දෙකක් ඇතුළත දී වවුනියාවේ දිසාපති තැනගේ සිත් ගන්නා පරිදි ඉඩමෙහි හින්දු පන්සලක් තනා නිම කළ යුතු ය ;
(ඈ) බදු ගන්නන් විසින් මෙම ඉඩම හින්දු පන්සලක් තැනීම පිණිස මිස අන් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය ;

3. මෙහි පහත දක්වෙන දිනයේ සිට සති 6 ක් ඇතුළතදී මෙකී ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු මා වෙත ලියා ඉදිරිපත් නොකළහොත් යථෝක්ත ඉල්ලීම පරිදි ඉඩම බදු දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 නොවැම්බර් මස 25 වැනි දින,
කොළඹ දීය.

11—1159

---

අංකය : ඇල්.ඇස්. 4658.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

මඩකලපු දිස්ත්‍රික්කයේ උතුරුමන්මුනේ පත්තුවට අයත් කට්ටන්කුඩියේ පිහිටි 6059 දරණ මූලික පිඹුරයේ 103 වැනි බිම් කැබැල්ලෙන් අක්කර 1 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් කායඝීලයක් හා ගබඩා ඉදිකිරීම සඳහා කට්ටන්කුඩියේ අංක 2 දරණ කොට්ඨාශයේ විවිධ සේවා සමූපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බැව් මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි.

ඉඩමෙහි මායිම් මෙසේය :—

උතුරට : රජයේ ඉඩම් ; දකුණට : පාර ; නැගෙනහිරට : පාර ; බටහිරට : රජයේ ඉඩම්.

2. අවශ්‍ය කාරණය සඳහා ඉඩම බදුදීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලටද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :—

(අ) කාලය : අවුරුදු 30 යි.
(ඉ) බද්ද : අවුරුද්දකට රු. 6 යි.
(උ) බදුගන්නා විසින් බද්ද ආරම්භ වූ අවුරුදු 1 ක් ඇතුළතදී මඩකලපුවේ දිසාපති තැනගේ සිත් ගන්නා පරිද්දෙන් එකී ඉඩමෙහි කායඝීලයක් හා ගබඩා තනා නිම කළ යුතුය.
(එ) බදුගන්නා විසින් මෙම ඉඩම කායඝීලයක් හා ගබඩා තැනීම පිණිස මිස අන්‍ය කටයුත්තක් සඳහා නොයෙද විය යුතුය.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුළතදී මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැණෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 නොවැම්බර් මස 25 වැනි දින,
කොළඹදීය.

11-1081

---

අංකය : ඇල්.ජේ. 1650—ඇල්.ඇල්. 673.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

මඩකලපු දිස්ත්‍රික්කයේ තන්ඩවන්වෙලි කල්ලියන්කාඩු ගමෙහි පිහිටි රජයේ ඉඩම් වලින් අඩි 150×150 ප්‍රමාණයේ රජයේ ඉඩම් කැබැල්ලක්, ත්‍රිකුණාමළයේ ගරු රාජගුරු ප්‍රසාදින් වහන්සේ විසින් තන්ඩවන්වෙලිහි පිහිටි මහළු මඩමට සුසාන භූමියක් ලෙස පාවිච්චි කිරීම සඳහා බදු ඉල්ලා ඇත.

ඉඩමට මායිම් :—

උතුරට : 6706 දරණ මූලික සිතියම.
දකුණට : අභ්‍යාස විද්‍යාලයට අයත් ඉඩම.
නැගෙනහිරට : ඇන්ග්ලිකන් සුසාන භූමිය.
බටහිරට : වැලිතලාව.

2. දැනට තිබෙන සුසාන භූමියෙහි බොහොමයක් මිනි වළලා තිබෙන හෙයින් එය ඉතාමත් තද බදව පවතින බැව් වාර්තාවේ. ඉඩම බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලට ද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට ඇත :—

(අ) කාලය : අවුරුදු 99යි.
(ආ) බදු මුදල : වර්‍ෂයකට ශත 25යි.
(ඉ) බදු ගන්නා විසින් ඉඩමෙහි වැට බැඳ එය තන්ඩවන්වෙලිහි පිහිටි මහලු මඩමේ සිටින අය සඳහා සුසාන භූමියක් පිණිස මිස අන් කිසිවක් සඳහා නොයෙදවිය යුතුය.

3. මෙහි පහත දැක්වෙන දිනයේ සිට සති 6ක් ඇතුළතදී මෙකී ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු මා වෙත ලියා ඉදිරිපත් නොකළහොත් යථෝක්ත ඉල්ලීම පරිදි ඉඩම බදු දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 නොවැම්බර් මස 25 වැනි දින,
කොළඹ දීය.

11-1160

---

ඇල්.ඞී. 13—ඇල්.ඊ. 1890.

## 21 (2) දරණ ඉඩම් රෙගුලාසිය යටතේ වූ නිවේදනයයි

හලාවත දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළයේ ආදායම් පාලක නිළධාරිතැනගේ කොට්ඨාශයට අයත් දකුණු කම්මල් පත්තුවේ, තෝප්පුතොට ගමෙහි පිහිටි, ඒ. 465 දරණ මූලික සිතියමේ, ප්‍රමාණයෙන් අ. 0, රූ. 3, ප. 05.6 ක් වන, අංක 2 දරණ බිම් කට්ටිය තමාට විකුණන ලෙස, දන්කොටුවේ තඹරවිල පදිංචි,

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු මහතා විසින් ඉල්ලුම්කොට තිබෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. මීට යාව, බස්නාහිරට පිහිටා තිබෙන තෝප්පුතෝට්ටම් නැමැති පුද්ගලික ඉඩමේම කොටසක් වන මෙම බිම් කට්ටිය, එම පිඹුරේමවූ අංක 1 දරණ බිම් කට්ටියත් සමග වර්ෂ 1937 දී කොච්චිකඩේ පාලම තැනීම සඳහා රජය මගින් අත්පත් කර ගන්නා ලදී. පසුව, එම කාරණය සඳහා එය අනවශ්‍ය බැව් පෙනීගියෙන්, තොප්පුතෝට්ටම් නැමැති ඉඩමෙහි දැනට අයිතිකරුවන ඉල්ලුම්කරුවෙත එම බිම් කට්ටිය වාර්ෂික බලපත්‍රයක් යටතේ බදු දෙන ලදී. දැනටත් එම ඉඩමට ඔහු එම බල පත්‍රය දරයි. මීට යාව තිබෙන පුද්ගලික ඉඩමට තවමත් අවශ්‍ය මෙම බිම් කට්ටිය එහි ආරක්ෂාව සඳහාද අත්‍යවශ්‍යබැව් වාර්තාවී ඇත. එම ඉඩමෙහි සෑහෙන ප්‍රමාණයේ ගෙයක් සාදා තිබේ. එබැවින්, රු. 4,710 කට, ඒ. 465 දරණ මූලික සිතියමේ බිම් කට්ටි අංක 2 ඉල්ලුම්කරු වෙත විකිණීමට රජය අදහස් කර තිබේ.

3. මෙහි පහත දක්වෙන දිනයේ සිට සති 6 ක් ඇතුළතදී මෙකී ඉඩම නොවිකිණිය යුතු බවට පිළිගැනෙන හේතු මා වෙත ලියා ඉදිරිපත් නොකළහොත් යථෝක්ත ඉල්ලීම පරිදි ඉඩම විකුණනු ලැබේ.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 නොවැම්බර් මස 25 වැනි දින,
කොළඹ දීය.

11—1162

---

අංකය : ඇල්.ඇස්. 4670.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර නුවරගම් පළාතට අයත් වහමල්ගොල්ලෑවේ පිහිටි 123 වැනි අවසාන ගම් පිඹුරයේ 1 වැනි බිම් කැබැල්ලෙන් අක්කර 1/2ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වී ගබඩාවක් ඉදි කිරීම සඳහා වහමල්ගොල්ලෑවේ විවිධ සේවා සමුපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බැව් මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි.

2. අවශ්‍ය කාරණය සඳහා ඉඩම බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලටද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :—

(අ) කාලය : අවුරුදු 30 යි ;

(ඉ) බද්ද : අවුරුද්දකට රු. 5 යි ;

(උ) බදුගන්නා විසින් බද්ද ආරම්භ වූ අවුරුදු 1ක් ඇතුළතදී අනුරාධපුර දිසාපති තැනගේ සිත් ගන්නා පරිද්දෙන් එකී ඉඩමෙහි ගබඩාවක් තනා නිම කළ යුතුය ;

(එ) බදුගන්නා විසින් මෙම ඉඩම ගබඩාවක් තැනීම පිණිස මිස අන්‍ය කටයුත්තක් සඳහා නොයෙද විය යුතුය.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුළත දී මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 නොවැම්බර් මස 25 වැනි දින,
කොළඹ දීය.

11—1156

---

අංකය : ඇල්. ඇස්. 4460.

## 21 (2) දරණ රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මින්නේරියේ පිහිටි ඇෆ්ප්. වී. පී. 9 දරණ ප්ලෑනේ නො. 219 හා 700 දරන ඉඩම් කට්ටිවලට අයත් ආණ්ඩුවේ ඉඩමෙන් අක්කර 2ක ප්‍රමාණයක් වී ගබඩාවක්, කායශාලයක් හා දුම්කොළ උදුන් සෑදීම සඳහා පුරාණ මින්නේරිය විවිධ සේවා සමුපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි.

2. අවශ්‍ය කාරණය සඳහා ඉඩම බදු දීමට පුළුවන. රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලටද යටත්කොට ඉඩම බදුදීමට රජය අදහස් කොට තිබේ :—

(අ) කාලය : අවුරුදු 30 ;

(ඉ) බද්ද : අවුරුද්දකට රුපියල් 20 ;

(උ) බදු ගන්නා විසින් බද්ද ආරම්භ වූ අවුරුද්දක් ඇතුළතදී පොළොන්නරුවේ සමුපකාර සංවර්ධන උප කොමසාරිස් විසින් කලින් අනුමත කරනලද සැලසුම් අනුව එකී ඉඩමෙහි වී ගබඩාවක්, කායශාලයක් හා දුම්කොළ උදුන් තනා නිම කළ යුතුය ;

(එ) බදු ගන්නා විසින් මෙම ඉඩම ඉහත (උ) ඡේදයේ සඳහන් කාරණා පිණිස මිස අන්‍ය කටයුතු සඳහා නොයෙදවිය යුතුය.

3. මෙහි පහත සඳහන් දින සිට සති 6ක් ඇතුළතදී මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 නොවැම්බර් මස 25 වැනි දින,
කොළඹදීය.

11-1155.

---

අංකය : එල්. එස්. 4599

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ වීරපුරේ පිහිටි 314 දරණ බිම් කැබලි කරන ලද සැලැස්මේ ට්‍රැක් 46 න් අක්කර දෙකක පමණ ආණ්ඩුවේ ඉඩම් කැබැල්ලක් ගබඩා හා දුම්කොළ උදුන් සෑදීම සඳහා වීරපුර විවිධ සේවා සමුපකාර සමිතිය විසින් බදු ඉල්ලා සිටින බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම ඉඩමේ මායිම් මෙසේ ය :—

උතුරට : අංක 6 දරණ අතුරු ඇල ; දකුණට : නොම්මර 167 හා 168 දරණ ඉඩම් කට්ටි ; නැගෙනහිරට : අතුරු ඇල ; බටහිරට : තඹාල පාර.

2. ඉල්වන ලද ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට තිබේ. රජයේ සම්මත සෙසු කොන්දේසි වලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලටද යටත් කොට ඉඩම බදු දීමට අදහස් කර තිබේ :—

(අ) කාලය : අවුරුදු 30 යි.

(ආ) බද්ද : අවුරුද්දකට රුපියල් 20 යි.

(ඇ) බදුගන්නා විසින් බද්ද ආරම්භවූ අවුරුදු දෙකක් ඇතුළත පොළොන්නරුවේ සමුපකාර උප කොමසාරිස් තැන විසින් කලින් අනුමත කරන ලද සැලසුම අනුව එකී ඉඩමෙහි ගබඩා සහ දුම්කොළ උදුන් තනා නිමකල යුතුයි.

(ඈ) බදුගන්නා විසින් මෙම ඉඩම ගබඩා සහ දුම්කොළ උදුන් සෑදීම පිණිස යොදනවා විනා අන්‍ය කටයුත්තකට නොයෙද විය යුතුයි.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුළතදී මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැණෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 නොවැම්බර් මස 25 වැනි දින,
කොළඹදීය.

11-1082

---

## ආණ්ඩුවේ ඉඩම්වල ඇති වගාවේ ප්‍රයෝජනය ගැනීමේ බදු වෙන්දේසියේ විකිණීමයි

1. වර්ෂ 1961ක්වූ ජනවාරි 1 වෙනි දින සිට 1961 දෙසැම්බර් 31 වෙනි දින දක්වා ඇති කාලය තුළ පහත සඳහන් උපලේඛනයට ඇතුළත් රජයේ ඉඩම් කට්ටිවල තිබෙන වගාවේ ප්‍රයෝජනය ගැනීමේ බද්ද, එම උපලේඛනයේ සඳහන් දින සහ ස්ථානවලදී වෙන්දේසිකර විකුණනු ලැබේ.

2. වෙන්දේසියේ ඉල්ලුම් කිරීමට අදහස් කරන අය විසින් තම ඉල්ලීම පිළිගනු ලැබුවහොත් තමා විසින් ඉල්ලුම් කරන ලද බදු මුදල් සම්පූර්ණයෙන්ම ඒ අවස්ථාවේදී ගෙවීමට සූදානම්ව පැමිණිය යුතුයි.

3. තෝරාගනු ලැබූ බදුකරුවන් රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා සමග බදු කොන්දේසි පත්‍රවලට අත්සන් කළයුතු වේ. ඉන්පසු ඉඩම් ලබාගත් අයට එම ඉඩම්වල බුත්තිය ගම්මුලාදෑනි තැන විසින් පසුව පවරා දෙනු ලැබේ.

4. බදුගත් කාල සීමාව තුළදී ඉඩමේ පිහිටි ගස්කොළත් ආදිය කපා උදුරා හෝ වෙනත් අලාභහානි සිදුකළහොත් ඒ සඳහා වන්දි මුදල් ගැනුම්කරුවන්ට ගෙවීමට සිදුවේ.

5. වෙන්දේසියේ විකුණන ලද එම බදු ඉඩම් රජයේ උවමනාවන්ට අවශ්‍යවී තිබී වැරදීමකින් හෝ නැතහොත් වෙනයම් කරුණක් නිසා හෝ විකුණන ලද බව වැටහුනොත් දිසාපතිතුමා විසින් බදු ඔප්පුව අවලංගු කරනු ලැබේ. වෙනත් අලාභයක් හෝ ආධාර වශයෙන් හෝ යම්කිසි මුදලක් ගෙවනු නොලැබේ.

6. වැසියන්ට ඉඩම් බෙදා දීම සඳහා හෝ වෙන අවශ්‍ය කාරණයකට මෙහි සඳහන් යම් ඉඩමක් ආණ්ඩුවට ආපසු උවමනා වුවහොත්, බදුකරු ඉඩම් නිරවුල්ව ආණ්ඩුවට භාරදිය යුතුයි. එවැනි අවස්ථාවකදී ඉතිරි කාලයට ගැනෙන මුදල බදුකරුට ගෙවනු ලැබේ.

7. මෙ පිළිබඳ වැඩි විස්තර ඉඩම පිහිටි ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරිතුමාගෙන් ලබාගත හැක.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ජේ. මෙන්ඩිස්,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා වෙනුවට.

1960 නොවැම්බර් 18 වැනි දින,
රත්නපුරය.

## උපලේඛනය

### කුකුළු කෝරළය

පහත සඳහන් ඉඩම් බදු දීම සඳහා 1960 දෙසැම්බර් මස 20 වන දින පෙරවරු 11ට අයගම සංචාරක බංගලාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියක් පවත්වනු ලැබේ :—

| අංකය | ලොට් අංක හා ගම් සිතියම් අංක | සාමාන්‍ය ප්‍රමාණය අ. | රූ. | ප. | වගාව | තක්සේරු මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|---|---|
| 1 | 421එල් අ.ග.සි. 41 ගවරගිරිය | 4 | 1 | 4 | රබර් | 156 | 0 |
| 2 | 139ඒ අ.ග.සි. 41 ගවරගිරිය | 0 | 1 | 0 | පුවක් | 1 | 20 |
| 3 | 249, 252, 253 අ.ග.සි. 41 ගවරගිරිය | 0 | 1 | 19 | පොල්, කොස්, දෙල් | 2 | 50 |
| 4 | 139 අ.ග.සි. 41 ගවරගිරිය | 0 | 0 | 30 | පොල්, පුවක්, කොස් | 2 | 0 |

පහත සඳහන් ඉඩම් බදු දීම සඳහා 1960 දෙසැම්බර් මස 21 වන දින පෙරවරු 11ට කලවානේ ආදායම් නිලධාරි තැනගේ කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියක් පවත්වනු ලැබේ :—

| අංකය | ලොට් අංක හා ගම් සිතියම් අංක | අ. | රූ. | ප. | වගාව | රු. | ශ. |
|---|---|---|---|---|---|---|---|
| 5 | 57 අ.ග.සි. 224 පරගල | 0 | 0 | 12 | කොස්, පොල්, පුවක් | 5 | 25 |
| 6 | 61 අ.ග.සි. 224 පරගල | 0 | 0 | 25 | කොස්, පොල් | 10 | 20 |
| 7 | 164 (රූ. 2ක කොටසක්) අ.ග.සි. 224 පරගල | 48 | 2 | 28 | පුවක් | 7 | 50 |
| 8 | 57 අ.ග.සි. 241 පිඹුර | 0 | 1 | 0 | කොස්, පොල්, පුවක් | 5 | 40 |
| 9 | 149 අ.ග.සි. 254 වරතැල්ගොඩ | 0 | 0 | 8 | කොස්, දෙහි, පොල් | 3 | 0 |
| 10 | 95,98 අ.ග.සි. 245 වේවැල්කඳුර | 1 | 0 | 0 | මිශ්‍ර වගාව | 36 | 0 |
| 11 | 151ජේ (කොටසක්) අ.ග.සි. 244 කලවාන | 0 | 0 | 20 | පොල්, පුවක්, කොස් | 2 | 0 |
| 12 | ලොට් 458 අ.ග.සි. 1 දෙල්ගොඩ | 2 | 2 | 0 | කොස්, පුවක් | 12 | 90 |

පහත සඳහන් ඉඩම් බදු දීම සඳහා 1960 දෙසැම්බර් 22 දින පෙරවරු 11ට වැද්දගල සංචාරක බංගලාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියක් පවත්වනු ලැබේ :—

| අංකය | ලොට් අංක හා ගම් සිතියම් අංක | අ. | රූ. | ප. | වගාව | රු. | ශ. |
|---|---|---|---|---|---|---|---|
| 13 | 22 අ.ග.සි. 945 වැද්දගල | 1 | 0 | 0 | පුවක්, දෙල් | 5 | 0 |

### නවදුන් කෝරළය

පහත සඳහන් ඉඩම් බදු දීම සඳහා 1960 දෙසැම්බර් 21 වන දින පෙරවරු 10ට කැටන්දෙල ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියක් පවත්වනු ලැබේ :—

| අංකය | ලොට් අංක හා ගම් සිතියම් අංක | අ. | රූ. | ප. | වගාව | රු. | ශ. |
|---|---|---|---|---|---|---|---|
| 1 | 156 (කොටසක්) අ.ග.සි. 431 බස්නාහිර මහබාගේ | 0 | 2 | 0 | පොල්, පුවක් | 6 | 0 |
| 2 | 58ඒ. ඒ2 අ.ග.සි. 92 මාරපොන | 0 | 3 | 39 | කොස්, දෙල් | 6 | 0 |

11–1030

---

## රත්නපුර දිස්ත්‍රික්කයේ රජය සතු ඉඩම්වල පිහිටි රබර්/තේ වගාවන්හි ප්‍රයෝජනය ගැනීම සඳහා බදු දීම

පහත සඳහන් උප ලේඛනයේ දක්වෙන රජයේ ඉඩම්වල පිහිටි රබර්/තේ වගාවන්හි ප්‍රයෝජනය ගැනීමෙ අයිතිය බදු ගැනීම සඳහා ටැන්ඩර් පත්‍ර (මෙහි පහත ' දිසාපති ' යයි නම් කරනු ලබන) රත්නපුර දිසාපති තැන විසින් භාරගන්නා බව මෙයින් නිවේදනය කෙරේ.

2. ටෙන්ඩර්පත්‍ර සීල් තබන ලද කවරවල බහා (''..............ඉඩමෙ රබර්/තේ වගාවේ ප්‍රයෝජනය ගැනීම සඳහා ටැන්ඩර් පත්‍රයයි '') සඳහන්කර 1961 ජනවාරි 3 වන දින උදේ 10ට පෙර රත්නපුර කච්චේරියට ලැබෙන්නට එවිය යුතුයි. එම වේලාවට ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. සියලුම ටැන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයන් ටැන්ඩර් විවෘත කරන අවස්ථාවේ එම ස්ථානයට පැමිණ සිටිය යුතුයි.

3. සියලුම ටැන්ඩර් 1960 දෙසැම්බර් 23 වන දින දවල් 12 දක්වා රත්නපුර දිසාපති තැනගෙන් ඉල්ලුම්කර ලබාගත් ෆෝර්මවල එවිය යුතුයි. නියමිත ෆෝර්මයේ නොවන ටැන්ඩර්පත්‍ර භාරගනු නොලැබේ. එක් එක් ඉඩම හෝ ඉඩම් කට්ටිය වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කළ යුතුය. ටැන්ඩර්කරුවන් විසින් ටැන්ඩර්පත්‍රයේ සඳහන් කළ යුත්තේ අවුරුද්දකට ගෙවීමට බලාපොරොත්තුවන බදු මුදලයි.

4. ටැන්ඩර්පත්‍ර නිකුත් කිරීමට පෙර එක් එක් ටැන්ඩර්පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10ක ඇප මුදලක් රත්නපුර කච්චේරියේ තැන්පත් කළ යුතුය. ටැන්ඩර් පත්‍රයක් පිළිගත් වහාම (5 වෙනි වගන්තියේ ප්‍රකාර) එම ටැන්ඩර් පත්‍රයේ සඳහන් පළමුවෙනි අවුරුද්දේ බදු මුදල නොගෙව්වොත් හෝ දින 10ක් ඇතුළතදී බදු කොන්දේසි පත්‍රයට අත්සන් නොකළහොත් හෝ එම තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ.

5. පිළිගත් ටැන්ඩර්පත්‍රයේ සඳහන් මුදල පළමුවෙනි අවුරුද්දේ බද්ද වශයෙන් ටැන්ඩර්පත්‍රය පිළිගත්.වහාම ගෙවිය යුතුය.

6. පිළිගත් ටැන්ඩර්කරු විසින් අත්සන් කළයුතු බදු කොන්දේසි පත්‍රයේ, වෙනත් කොන්දේසිවලට අමතර වශයෙන් පහත සඳහන් කොන්දේසි ඇතුලත් වේ :—

(අ) බදු කාලය 1965 දෙසැම්බර් 31 දින වන දක්වා වේ.
(ආ) බලපත්‍රයේ සඳහන් වන දිනට පෙර නියමිත ස්ථානයේදී ඊළඟ අවුරුදුවල බදු මුදල් ගෙවිය යුතු වේ.
(ඉ) බදු ගැනුම්කරුවන් විසින් කිසිම ගොඩනැගිල්ලක් බදු ඉඩමෙ ගොඩනැන්විය නොහැක.
(ඊ) බදුගැනුම්කරුවන් විසින් දිසාපතිතුමාගේ සිත්ගන්නා පරිද්දෙන් බදු ඉඩම පිරිසිදුව හා හොඳ තත්වයේ තබාගත යුතුය.
(උ) බදුගැනුම්කරුවන් විසින්, දිසාපති තැන කලින් කල නියම කරන අන්දමට ඉඩමේ පස සේදී යෑම වැළැක්වීම සඳහා කටයුතු කළ යුතුවේ.
(ඌ) බදුගැනුම්කරුවන් විසින් ඉඩමේ කිසිම අළුත් වගාවක් දැමීම හෝ පස් ඉවත් කිරීම කළයුතු නොවේ.
(එ) බදුගැනුම්කරුවන් විසින් රබර් ගස්වල උඩු.අළු නොකපා ගස් හොඳ තත්වයේ තබාගත යුතුය.
(ඒ) බදුගැනුම්කරුවන් විසින් තේ/රබර් පාලක ආඥපනත යටතේ කටයුතු කළයුතුවත් හැර ඒ සම්බන්ධව යන සෑම වියදමක්ම දැරිය යුතුයි.
(ඔ) ඉහත සඳහන් කොන්දේසි එකක් හෝ වැඩි ගණනක් උල්ලංඝනය කිරීම, කිසිම වන්දි මුදලක් නොගෙවා බදු බලපත්‍රය එවෙලේම අවලංගු කිරීමට හේතු වේ.
(ඕ) බදු බලපත්‍රයේ කාලය අවසන් වීමෙන් පසුව හෝ කලින් අවලංගු කිරීමෙන් පසුව හෝ බදුගැනුම්කරුවන් විසින් ඉඩමේ නිරවුල් අයිතිය දිසාපතිතැනට හෝ ඔහුගේ බලය ලත් හෝ ආඥාව පිට කටයුතු කරන කවරෙකුට හෝ භාරදිය යුතුය. දිසාපතිතැන හෝ ඔහුගේ බලය ලත් අන් අයෙකු හෝ බදු කාලය අවසන් වූ විට හෝ කලින් බද්ද අවලංගු කළ විට ඉඩමට ඇතුල් වී රජය වෙනුවෙන් භුක්තිය භාරගන්නවා ඇත.

7. ඕනෑම ටැන්ඩර් පත්‍රයක් පිළිගැනීමෙ හෝ ප්‍රතික්ෂෙප කිරීමේ බලය දිසාපති තැන සතුවේ.
8. වෙනත් විස්තර දිසාපතිතැනගෙන් දැනගත හැක.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ජේ. මෙන්ඩිස්,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1960 ක්වූ නොවැම්බර් මස 17 වනද,
රත්නපුර දිසාපති කාර්යාලයේදිය.

## උපලේඛනය

### කුකුළු කෝරළය

| අංකය | ගම | බිම් කට්ටිය | සාමාන්‍ය ප්‍රමාණය අ. | රූ. | ප. | වගාව | තක්සේරු මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | අයගම අ.ග.සි. 42 | 91 | 0 | 1 | 0 | රබර් | 7 | 20 |
| 2 | අයගම අ.ග.සි. 42 | 116, 116බී | 0 | 3 | 0 | රබර් | 21 | 0 |
| 3 | අයගම අ.ග.සි. 42 | 98 (කොටසක්) | 1 | 0 | 0 | රබර් | 3 | 60 |
| 4 | අයගම අ.ග.සි. 42 | 866ජේ | 1 | 2 | 25 | රබර් | 15 | 0 |
| 5 | අයගම අ.ග.සි. 42 | 866කිව්, 866ඔ | 12 | 0 | 32 | රබර් | 200 | 0 |
| 6 | අයගම අ.ග.සි. 42 | 723ටී | 0 | 0 | 20 | රබර් | 6 | 0 |
| 7 | අයගම අ.ග.සි. 42 | 681සී,683ඒ, 681ඩී | 5 | 0 | 2 | රබර් | 25 | 0 |
| 8 | අයගම අ.ග.සි. 42 | 924ඒ, 926ඒ, 924බී, 926බී, 883බී | 4 | 1 | 34 | රබර් | 34 | 0 |
| 9 | අයගම අ.ග.සි. 42 | 147, 149 | 15 | 0 | 0 | රබර් | 407 | 0 |
| 10 | අයගම අ.ග.සි. 42 | 510 1/2, 171ඒ, 190ඒ | 3 | 0 | 26 | රබර් | 45 | 0 |
| 11 | ගවරගිරිය අ.ග.සි. 41 | 141 | 0 | 0 | 12 | රබර් | 1 | 0 |
| 12 | එම | 278 | 1 | 3 | 1 | රබර් | 4 | 50 |
| 13 | එම | 126එෆ් | 1 | 3 | 6 | රබර් | 18 | 0 |
| 14 | එම | 278ඒ, 278එම් | 0 | 0 | 20 | රබර් | 1 | 0 |
| 15 | එම | 126ඩී | 2 | 1 | 2 | රබර් | 15 | 0 |
| 16 | එම | 200ඩී | 0 | 1 | 6 | රබර් | 2 | 70 |
| 17 | එම | 682වයි | 4 | 2 | 28 | රබර් | 51 | 0 |
| 18 | එම | 200ඔ | 1 | 2 | 36 | රබර් | 1 | 80 |
| 19 | එම | 478ජේ | 0 | 1 | 28 | රබර් | 4 | 30 |
| 20 | එම | 125 | 0 | 1 | 0 | රබර් | 1 | 80 |
| 21 | උඩුගල අ.ග.සි. 239 | 51,89ඒ | 1 | 2 | 39 | රබර් | 40 | 0 |
| 22 | ගෙදගල අ.ග.සි. 240 | 4ඒ | 3 | 3 | 31 | රබර් | 15 | 0 |
| 23 | එම | 31 | 6 | 3 | 13 | රබර් | 115 | 0 |
| 24 | එම | 4අයි, 4ජේ | — | | | රබර් | 5 | 0 |
| 25 | වරතැල්ගොඩ අ.ග.සි. 254 | 84කිව් | 0 | 1 | 18 | රබර් | 3 | 0 |
| 26 | එම | 44,44බී, 44සී | 6 | 2 | 23 | රබර් | 48 | 0 |
| 27 | පරගල අ.ග.සි. 224 | 216ජී | 2 | 0 | 6 | රබර් | 3 | 0 |
| 28 | එම | 151 | 0 | 2 | 9 | රබර් | 6 | 0 |
| 29 | පිඹුර අ.ග.සි. 241 | 131වයි | 7 | 0 | 9 | රබර් | 33 | 0 |
| 30 | එම | 109සී, 109ඩී, 153 | 0 | 3 | 32 | රබර් | 13 | 20 |
| 31 | ජේඩිකන්ද අ.ග.සි. 243 | 36 (කොටසක්) | 5 | 0 | 0 | රබර් | 33 | 0 |

### නවදුන් කෝරළය

| අංකය | ගම | බිම් කට්ටිය | සාමාන්‍ය ප්‍රමාණය අ. | රූ. | ප. | වගාව | තක්සේරු මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | වතුපිටිය අ.ග.සි. 202 | 1 | 0 | 0 | 10 | රබර් | 12 | 0 |
| 2 | ලෙල්ලොපිටිය අ.ග.සි. 208 | 344 | 0 | 0 | 30 | තේ | 13 | 0 |
| 3 | කරවිට අ.ග.සි. 39 | 63 | — | | | රබර් | 10 | 0 |
| 4 | එම | 63 (කොටසක්) | 0 | 2 | 0 | රබර් | 35 | 0 |
| 5 | බ. මහබාගේ අ.ග.සි. 415 | 128, 129 | 0 | 3 | 17 | රබර් | 6 | 0 |
| 6 | මොරතොට අ.ග.සි. 183 | 99 | 2 | 3 | 38 | රබර් | 9 | 0 |
| 7 | ලෙල්ලොපිටිය අ.ග.සි. 208 | 344 | 0 | 0 | 30 | රබර් | 13 | 0 |
| 8 | බ. මහබාගේ අ.ග.සි. 427 | 8ජේ (කොටසක්) | 0 | 0 | 10 | රබර් | 9 | 0 |

11–1032

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.